**ශීර්ෂය 180 - සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**
**2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**1 කොටස**

**සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.957,875,000 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.747,801,019 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.36,141,717 ක් හා රු.173,932,264 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ක් හා සියයට 23 ක් වී තිබුණි.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 180 | 212,890,000 | 176,748,283 | 36,141,717 | 17 |
| 289 | 744,985,000 | 571,052,736 | 173,932,264 | 23 |
| **එකතුව** | **957,875,000** | **747,801,019** | **210,073,981** | **22** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 18001 | 3,500,000 | 2,222,671 | 900,000 | 2,116,987 | 10,000,000 | 6,382,237 |
| 28901 | 31,000,000 | 18,833,176 | 20,000,000 | 26,630,969 | 118,000,000 | 82,334,865 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.3.1 අග්‍රිම ගිණුම්

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.573 ක් විය.

### 2.3.2 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.3,207,738 ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0189/000 | 71,844 |
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0144/000 | 3,135,894 |
| එකතුව | | 3,207,738 |

## 2 කොටස

----------

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

### 1. ශීර්ෂය 180 - සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 08 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි සඳහන් පොදු නිරීක්ෂණය සහ පහත 1.4 සිට 1.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 ත් සියයට 98 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ii) අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් බැවින් විදුලිය හා ජලය සඳහා සළසා ගත් ප්‍රතිපාදන යොදා ගැනීමට අවශ්‍ය නොවූ බව පසුගිය වර්ෂයේදී ද ප්‍රතිපාදන ඉතිරියට හේතු ලෙස දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ද රු.400,000 ක ප්‍රතිපාදනයන් සළසා ගෙන එම ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි. ඉතිරි මුළු ප්‍රතිපාදනයම වැය නොකර ඉතිරියට හේතු ලෙස එම හේතුවම ඉදිරිපත් කර තිබුණි.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන බේරුම් නොකළ බැරකම් රු.3,837,871 ක් වූ අතර එදිනට බැරකම් 04 ක වටිනාකම රු.34,076 ක් ඊට ඇතුළත්ව නොතිබුණි.

## 1.5 කාර්ය සාධනය

2013 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් ලෙස කුළු බඩු හා ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදන අලෙවි මණ්ඩලයේ වත්කම් සුරක්ෂිත කිරීම බව දක්වා තිබුණත්, එම මණ්ඩලයේ වත්කම් 2009 වර්ෂයේදී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුණි. කෙසේවුවද එහි ඇවර කිරීමේ ගිණුම් පිළියෙල කර මණ්ඩලය ඇවර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **සැලැසුම් කිරීම**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැළැස්මට අනුකූලව ක්‍රියා නොකර තිබුණු බව නිරික්ෂණය විය.

(i). මඩු ප්‍රදේශයේ හා උතුරු පළාතට අයත් දිස්ත්‍රික්කවල කජු වගාව ප්‍රවර්ධනය සඳහා වැඩසටහනක් සැකසීම.

(ii). ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා බලගැන්වීමේ වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කිරීම.

(iii). නව කුළුබඩු භෝග 02 ක් හඳුන්වාදීම.

1.6 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 08 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 51 | 29 | 22 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 27 | 23 | 04 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 02 | 01 | 01 |
| | **එකතුව** | **95** | **62** | **33** |

ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 ක් ඇතුළත්ව තනතුරු 33 ක් පිරවීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 2. ශීර්ෂය 289- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

---

### 2.1 විගණන විෂය පථය

---

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 04 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන් , වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන යාවත්කාලීන නොකිරීම**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.5,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) පුනරාවර්තන වැය විෂයයන් 07 ක හා මූලධන වැය විෂයයන් 13 කට අධිප්‍රතිපාදන සළසා තිබිම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරියේ එකතුව රු.172,264,889 ක් වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂයයට සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 සිට සියයට 74 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ රු.1,167,998 ක් වූ තැන්පතු 33 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 28901 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳව 2013 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,015,972 ක් වූ අතර, එම හිඟහිටි ශේෂවලින් රු.355,307 ක් වර්ෂ 11 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂ විය.

**2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**විගණන හා කළමනාකරණ කමිටුව පැවැත්වීම**

2013 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 03ක් පමණක් පවත්වා තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

-----------------------------

වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත වර්ගකර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| (i) | වහලය එහා මෙහා කළ හැකි වන පරිදි සකසන ලද වියලන කමත සහිත ගොඩනැගිල්ල | 01 | ඉතා පැරණි |
| (ii) | ගොඩනැගිලි ( සවිකිරීම් ඇතුළුව) | 01 | 2009 සිට |
| (iii) | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 07 | -එම- |
| (iv) | ඇසුරුම් කඩදාසි (සණ) | සණ මීටර් 10 | -එම- |
| (v) | බයින්ඩින් රෝල් (ලොකු) | 30 | -එම- |
| (vi) | තීන්ත (ලීටර් 10) | 08 | -එම- |
| (vii) | පරිගණක යන්ත්‍ර | 01 | -එම- |
| (viii) | තෙකලා විදුලි සම්බන්ධතා | 01 | -එම- |
| (ix) | ගම්මිරිස් බීජ වෙන්කරන යන්ත්‍ර | 01 | 2013 සිට |
| (x) | ගම්මිරිස් බොල් ඉවත්කරන යන්ත්‍ර | 01 | -එම- |

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා

--------------------------------------

2013 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා පරීක්ෂා කිරීමේ දී ඇතැම් අංශවල සමීක්ෂණ කටයුතු සඳහා පත්කළ නිලධාරීන් ඒ සඳහා උපයෝගී කර ගන්නා පොදු 66 ආකෘතියේ ලෙජරය අනුව ශේෂය පමණක් දක්වා තිබුණි. එම ආකෘති පත්‍රය අනුව භාණ්ඩ සමීක්ෂණය කර තථ්‍ය ශේෂය, අතිරික්තය හෝ ඌනතාවය දක්වා

නොතිබුණත්, අදාල අංශ ප්‍රධානීන් විසින් එම සමීක්ෂණ කටයුතු නිවැරදිව සිදුකර ඇති බව සාවද්‍ය ලෙස ප්‍රකාශ කර එම වාර්තා සහතික කර තිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

රජයේ හා පුද්ගලික ආයතන සතුව තිබූ ඉඩම් ඒකක 46 ක් විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතා කර තිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01ට අඩු බේරුම් නොකළ බැරකම් රු.105,196,568 ක් පැවතුණි.

## 2.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XII පරිච්ඡේදයේ 23.18 වගන්තිය | -- | රජයේ නිලධරයන් දිවයිනෙන් බැහැර ගත කරන නිවාඩු පිළිබඳ වාර්තාවක් දෙපාර්තමේන්තු ප්‍රධානියා මාස්පතා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

-------------------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 115(3)(අ) | 300,000 | 2013 අගෝස්තු මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදයට අදාල එකතුව රු.300,000 ක් වටිනා ගෙවීම් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂවරයෙකුගේ අනුමැතිය මත 2014 අප්‍රේල් මාසයේදී ගෙවා තිබුණි. |

**2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

2009 වර්ෂයේ කොරියානු රජයේ (KOICA) මිත්‍රත්ව සංගමය මඟින් ලබාදුන් ආධාර උපයෝගී කරගෙන 2009 නොවැම්බර් 16 දින වන විට ගොඩනැගිල්ලක් ඉදිකර ව්‍යාපෘතියට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සපයා සවිකර තිබුණද, 2014 ජූලි 17 දින වන විටත් ව්‍යාපෘතියේ වැඩකටයුතු ආරම්භ කර නොතිබුණි.

**2.8 කාර්යසාධනය**

දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය පරමාර්ථය "ජාතික නිෂ්පාදනයේ ධාරිතාවය වැඩි කිරීම තුළින් ආනයනය සීමා කර අපනයන ප්‍රවර්ධනයට ක්‍රියා කිරීමයි". මේ සඳහා දෙපාර්තමේන්තුව තුළ වෙනම පර්යේෂණ අංශයක් පිහිටුවා තිබුණද එම අංශය විසින් එළිදැක්වෙන නව සොයා ගැනීම් (ප්‍රතිඵල) ක්ෂේත්‍රයට ගෙනයෑමට දෙපාර්තමේන්තුව තුළ පැහැදිලි වැඩ පිළිවෙලක් නොතිබුණි. මේ හේතුවෙන් 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ක්‍රියාත්මක පර්යේෂණ 129 න් පර්යේෂණ 54 ක ප්‍රතිඵල එළිදක්වා තිබුණද, ඒවා ක්ෂේත්‍රයට ගෙනයාමට කටයුතු කර නොතිබුණි.

**2.9 පාඩු හා හානි**

දෙපාර්තමේන්තුව සතු වාහන 02 කට පිළිවෙලින් 2012 ජූනි 26 දින හා 2012 දෙසැම්බර් 12 දින අලාභ හානි සිදුවී තිබූ අතර, මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාව 2014 මැයි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 2.10 විසදා නොතිබුණු විගණන ඡේද

2014 පෙබරවාරි 20 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී දෙපාර්තමේන්තුව ලබාදුන් පිළිතුරු අනුව නාලන්ද පිරිසැකසුම් මධ්‍යස්ථානයේ යන්ත්‍ර උපකරණ මාතලේ ඇල්වල පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණද, 2014 ජූලි 17 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එම වත්කම් අභාවිතව මාතලේ පැලැටි සංරක්ෂණ මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලක ස්ථාන ගත කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 45 | 40 | -- |
| (ii) | තෘතියික මට්ටම | 28 | 10 | 18 | -- |
| (iii) | ද්විතියක මට්ටම | 800 | 609 | 191 | -- |
| (iv) | ප්‍රාථමික මට්ටම | 353 | 293 | 60 | -- |
| (v) | වෙනත්(අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්) | 97 | 158 | -- | 61 |
| | **එකතුව** | **1,363** | **1,115** | **309** | **61** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට කාර්ය මණ්ඩල පුරප්පාඩු තනතුරු 309 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත අනුමත සේවක සංඛ්‍යාවට අමතර වශයෙන් සේවකයින් 61 දෙනෙකු බඳවා ගෙන තිබුණු අතර, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.